# ආරක්ෂක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා පොලීසියේ සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින පොලිස් නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම

ශ්‍රී ලංකාවේ නීතිය හා සාමය සුරක්ෂිත කිරීමේ කාර්යාවලිය වඩාත් ශක්තිමත්ව පවත්වාගෙන යාමට දායක වීම පිණිස දැනට සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින **ශ්‍රී ලංකා පොලීසියේ (විශේෂ කාර්ය බළකාය ද ඇතුළත්ව)** නිලධරයන් විසින් දිගින් දිගටම සිදු කරනු ලබන අභියාචනා සැලකිල්ලට ගෙන ඔවුන්ව නැවත සේවයේ පිහිටුවීමට සලකා බැලීම සඳහා 2020.02.19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම විධිමත් හා පාරදෘශ්‍ය ක්‍රියාවලියක් ඔස්සේ ත්‍රි පුද්ගල කමිටුවක නිර්දේශ මත සිදු කෙරේ. මේ වන විට සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම සලකා බැලීම පහත කොන්දේසිවලට යටත්ව සිදු කිරීමට නියමිතය.

- **2009.06.01 දිනට පසු සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන්**

  i. 2020.01.01 දිනට වයස අවුරුදු 50 ට වඩා අඩු විය යුතුය.

  ii. සේවය අතහැරයාමේ නියෝග ලබා සිටි කාලයට අදාළව සිදු කෙරෙන පසුබිම් පරීක්ෂණයකට හා නැවත සේවයට බඳවා ගැනීමට තරම් යහපත් මානසික හා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වන්නේ ද යන්න සනාථ කර ගැනීම සඳහා පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

  iii. වෛද්‍ය පරීක්ෂණයේදී පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් ඔහු / ඇය නැවත සේවයේ පිහිටුවීමට නුසුදුස්සෙකු නොවන බවට සනාථ කළ යුතු අතර, පසුබිම් වාර්තා හා වෛද්‍ය වාර්තා නැවත කමිටුව වෙත යොමු කිරීමෙන් පසුව කමිටුව විසින් අවසාන තීරණය ගනු ලබනු ඇත. එම තීරණය අවසානාත්මක වේ.

  iv. එලෙස නැවත සේවයේ පිහිටවනු ලබන නිලධරයන් පොලිස්පති විසින් යොමු කරනු ලබන මසකට නොඅඩු කාලයක ධාරිතා පුහුණුවකට යටත් වන අතර, පොලිස්පතිවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රදේශයක වසර 03 ක අවම කාලයක් සේවය කළ යුතුය. එම කාල සීමාව තුළ ස්ථාන මාරුවීමක් අපේක්ෂා කරන්නේ නම් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ යුතුය.

  v. සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන් නැවත සේවයේ පිහිටුවීමේදී ඔවුන්ගේ වැටුප් පියවර වනුයේ ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ VII වන පරිච්ඡේදයේ 8:1 වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව තනතුර අතහැරයාමේ නියෝග ලබන අවස්ථාවේ දරමින් සිටි තනතුරේ මූලික වැටුප් පියවර වේ.

  vi. මෙසේ නැවත සේවයේ පිහිටුවන ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම සලකා බැලීම සඳහා ඔවුන්ගේ පූර්ව සක්‍රීය සේවා කාලයද ගණනය කරනු ලැබේ.

- **2009.06.01 දිනට පෙර සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන්**

  ඉහත කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි අදාළ වේ.

  i. සේවය අතහැරයාමේ නියෝග ලැබීමට පූර්වයෙන් වූ සේවා කාලය තුළ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල (මෙහෙයුම් කලාප තුළ) අවම වශයෙන් වසරක කාලයක් සේවය කර තිබිය යුතුය.

  ii. සේවය අතහැරයාමේ නියෝග ලැබීමට පූර්වයෙන් වූ සක්‍රීය සේවා කාලය, 2020.01.01 දිනට ගණනය කරනු ලබන සේවයේ නොසිටි කාලයට වඩා වැඩි විය යුතුය.

දැනට සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින නිලධරයන් තම අභියාචනා මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව පහත ලිපිනයට 2020.07.17 දින හෝ ඊට ප්‍රථමයෙන් ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීම හෝ පහත විද්‍යුත් ලිපිනය ඔස්සේ ලැබීමට සැලැස්විය යුතුය.

**අතිරේක ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය (නීතිය හා සාමය අංශය),**
**14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල.**
**විද්‍යුත් ලිපිනය :**-adlseclaw1@defence.lk

කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"නැවත සේවයේ පිහිටුවීම - 2020"** ලෙස සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

මේ සම්බන්ධයෙන් තොරතුරු www.defence.lk හා www.police.lk යන වෙබ් අඩවියන් ඔස්සේ සහ කාර්යාල වේලාවන් තුළදී දුරකථන අංක 0112887884 ඔස්සේ ලබා ගත හැකිය.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5,**
**බාලදක්ෂ මාවත, කොළඹ 03.**
**2020.06.17**

### ශ්‍රී ලංකා පොලීසියේ සේවය අතහැරයාමේ නියෝග ලබා සිටින පොලිස් නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම සලකා බැලීම සඳහා වූ ආකෘති පත්‍රය.

1. අභියාචක නිලධරයාගේ නම : ....................
2. සේවය අතහැරයාමේ නියෝග ලබන විට දැරූ නිලය හා නිල අංකය : ....................
3. සේවය අතහැරයාමේ නියෝග ලබන විට අනුයුක්තව සිටි,
   I. කොට්ඨාසය : ....................
   II. පොලිස් ස්ථානය/ ඒකකය/ කාර්යාංශය : ....................
4. උපන් දිනය : ....................  4. (i) පෞද්ගලික ලිපිනය : ....................
   (ii) දුරකථන අංකය : ....................
5. සේවයට බැඳුණු දිනය : ....................
6. සේවය අතහැර ගිය දිනය : ....................
7. සේවය අතහැරයාමේ නියෝග ලබන විට සක්‍රීය සේවා කාලය : අවු: [ ] මාස: [ ] දින: [ ]
8. 2020.01.01 දිනට වයස : අවු: [ ] මාස: [ ] දින: [ ]
9. මීට පෙර සේවය අතහැරයාමේ නියෝග ලබා ඇත්නම්,
   i. සේවය අතහැරයාමේ නියෝගය ලද දිනය : ....................
   ii. නැවත සේවයේ පිහිටවූ දිනය : ....................
10. සේවය අතහැරයාමේ නියෝග ලබා සිටි කාල සීමාව තුළ පදිංචිව සිටි ස්ථිර/ තාවකාලික ලිපිනයන් අදාළ පොලිස් වසමද ඇතුළත්ව

| ස්ථිර / තාවකාලික ලිපිනය | පොලිස් වසම | පදිංචිව සිටි කාල සීමාව |
| --- | --- | --- |
| | | |

11. සේවය අතහැරයාමේ නියෝග ලබා සිටි කාල සීමාව තුළ කවර හෝ අධිකරණයකින් වරදකරු වී තිබේද / නැද්ද යන්න වග ( සියලු විස්තර දැක්විය යුතුය)
12. සේවය අතහැරයාමේ නියෝගයට එරෙහිව අභියාචනා සිදු කරන ලද්දේ නම් ඒ පිළිබඳ විස්තරය :

| අභියාචනා කළ දිනය | අභියාචක බලධාරියාගේ තීරණය |
| --- | --- |
| | |

13. සේවය අතහැරයාමට පදනම් වූ හේතු : ....................
    (අදාළ හේතුන් සවිස්තරාත්මකව සාක්ෂි සහිතව දැක්විය යුතුය)
    සේවය අතහැරයාමේ නියෝග ලැබීමට ප්‍රථමයෙන් මෙහෙයුම් කලාපයන්හි සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තරය

    මෙහෙයුම් කලාප — සේවා කාලය
    (1) ....................දින සිට ....................දක්වා
    (2) ....................දින සිට ....................දක්වා

ඉහත තොරතුරු මාගේ දැනීමේ ප්‍රමාණයට නිවැරදි බවටත් සත්‍ය බවටත් නැවත සේවයේ පිහිටුවීමට තීරණය කරනු ලැබුවහොත් එම නැවත සේවයේ පිහිටුවීමේදී පනවනු ලබන ඕනෑම කොන්දේසියකට යටත්ව සේවයට වාර්තා කිරීමට එකඟ වන බවත්, යම් හෙයකින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක නැවත සේවයේ පිහිටුවීමට නුසුදුස්සෙකු වන බව මා දැනුවත්ව සිටින බවට මෙයින් ප්‍රකාශ කරමි.

....................  ....................
අභියාචක නිලධරයාගේ නම හා අත්සන — දිනය